(36)

2013

# UNIVERSITY OF MORATUWA, SRI LANKA
## DEPARTMENT OF INTEGRATED DESIGN

| | | |
|---|---|---|
| **TITLE** | : | **B.Des. APTITUDE TEST** |
| **DATE** | : | **September 2013** |
| **DURATION** | : | **Three [3] Hours** කාලය පැය තුනයි |

උපදෙස්

1. සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
2. ඉංගිරිසි මුල් ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය.
3. ලිඛිත පිළිතුරු ඉංගිරිසි භාෂාවෙන්ම විය යුතුය.
4. ප්‍රශ්න පත්‍රයන්හි සිංහල සහ දෙමළ පරිවර්තන පැහැදිළි කිරීම සඳහා පමණි.

ප්‍රශ්නය 01 . [ලකුණු 25]

01.[a] සාමාන්‍ය භාවිතයේදී දබරැඟිල්ල සහ මහපට ඇඟිල්ල යොදා ගනිමින් හසුරුවන උපකරණ හෝ උපාංග 5 ක රූ සටහන් ඇඳ ඒවා නම් කරන්න. [ලකුණු 10]

01.[b] ඔබ 01.[a] හි සැපයූ පිළිතුරෙහි අඩංගු එක් උපකරණයක් / උපාංගයක් තෝරා ගෙන එය සාමාන්‍ය ප්‍රමාණයට සාපේක්ෂව පණස් [50] ගුණයක් විශාල කළ හොත් යොදා ගත හැකි භාවිතයයන් මොනවාදැයි රූප සටහන් ඇසුරින් දක්වන්න. අවශ්‍ය පරිදි ලිඛිත සටහන් යොදාගන්න. [ලකුණු 15]

ප්‍රශ්නය 02. [ලකුණු 15]

"A Sri Lankan court banned the sale and advertising of all ******** Ltd. milk products for two weeks. A trade union had sought the court ban because ******** products suspected of being contaminated with the agricultural chemical dicyandiamide (DCD) were still in the market.

- www.theindependent.lk"

උක්ත සඳහන් වෘත්තීය සමිතියේ අනුග්‍රාහකත්වයෙන් දේශීය පෞද්ගලික රූපවාහිනී නාලිකාවක ප්‍රචාරය කිරීම සඳහා නැවුම් කිරි පානය ප්‍රචලිත කිරීම අරමුණු කොට ගත් තත්පර 30 ක දැන්වීමක් නිර්මාණය කරන්න. ඔබේ දැන්වීම එහි වැදගත් ම රූප රාමු 3 ක් සහ හඬ පට කොටස් ඇසුරින් විදහා දැක්වීම පිණිස ලබා දී ඇති ක්‍රමවේදය භාවිත කරන්න.

**ප්‍රශ්නය 03** [ලකුණු 15]

03.[a] ලබා දී ඇති වචන කට්ටල තුනෙන් එකක ඇති වචන වලින් තුනක් ඇතුළත් වන පරිදි තනි වාක්‍යයේ කතාන්දරයක් නිර්මාණය කරන්න. [ලකුණු 5]

03.[b] ඔබේ ඉහත 03.[a] පිළිතුරට අදාළ කතාන්දරය ලබා දී ඇති රාමු තුළ චිත්‍ර කතාවක් ලෙස ප්‍රතිනිර්මාණය කරන්න. [ලකුණු 10]

**ප්‍රශ්නය 04** [ලකුණු 15]

සෙවනැලි රටාවන් අධ්‍යයනය කරමින් ලබා දී ඇති රූ සටහන් වල සංගතව පවත්නා ත්‍රිමාන වස්තූන් ඒවායේ බාහිර රේඛා ඇඳීම මගින් මතු කරන්න.

**ප්‍රශ්නය 05** [ලකුණු 30]

ලබා දී ඇති රූ සටහන් හතර එකම ස්ථානයක ප්‍රධාන දිශා හතරෙන් පෙනෙන ආරෝහණයන් වෙයි. අදාල රාමු වල සඳහන් කොට ඇති පර්යාවදර්ශනයන් එම රාමු තුළ නිර්මාණය කරන්න.

රාමු අංක 01 - සුනඛයා දකුණු දිශාව බැලූ විට පෙනෙන ආකාරය. [ලකුණු 10]

රාමු· අංක 02 - කාන්තාව උතුරු දිශාව බැලූ විට පෙනෙන ආකාරය . [ලකුණු 10]

රාමු අංක 03 - දක්වා ඇති ආසනයෙහි වාඩිවී සිටින පුද්ගලයකු උතුරු දිශාව බැලූ විට පෙනෙන ආකාරය. [ලකුණු 10]